


දයා පෙතියගොඩ කියන නම මුලින්ම මම දැක්කෙ "පත්වීම" කෙටි කතා සංග්‍රහයෙන්. ඒකෙ හයවෙනියට තිබුණ "කාලයාගේ ඇවෑමෙන්" කෙටිකතාව පෙතියගොඩගෙ. ඒ කෙටිකතාවෙ භාෂාව වගේම අන්තර්ගතයෙ තිබුණ අමුතු වෙනස මගේ හිත ගත්තා. ඔය අතරෙ මා හිත මිත්‍ර බාලචන්ද්‍ර මහත්තයා එයාගෙ මිත්‍රයෙක් වෙච්ච "පෙත්ත" ගෙ නිර්මාණ ඇතුලත් වෙබ් අඩවියක විස්තර මට එවල තිබුණා. ශීත සෘතුවෙ ලෙඩ ඇඳට වැටිලා හිටපු ටිකේ අර වෙබ් අඩවිය සම්පූර්ණයෙන්ම බලලා ඉවර කරන්න ඉස්පාසුවක් ලැබුණා. නමසිය හැට ගනන් වල ලංකාවෙ උඩරට ජන ජීවිතය ගැන පෙතියගොඩ අපූරුවට ලියල තිබුණා. ඔහුට දුරකතනයෙන් කතා කරලා විස්තර හුවමාරු කරගන්න බාලචන්ද්‍ර මහත්තයා උදව් කරා.ඒ සියල්ල අවසාන-යේ කාලෙකට පස්සෙ පත්තරේට ලිපියක් ලියන්න උවමනාවක් ඇතිවුණා.
දයා පෙතියගොඩ ඉපදිලා තියෙන්නෙ 1948 අවුරුද්දෙ මහනුවරදී. කිංස්වුඩ් විද්‍යාලයේ ආදිශිෂ්‍යයෙක් වුණ ඔහු පේරාදෙණිය විශ්ව විද්‍යාලයට ඇතුලත් වෙලා උපාධිය හදාරලා පසුව වැඩිදුර අධ්‍යාපනයට ක්වීන්ස්ලන්ත සරසවියට ඇතුලත් වෙලා තියෙනවා. පෙතියගොඩ වෘත්තියෙන් භූ විද්‍යාඥයෙක් විදියට දෙරටෙම කටයුතු කරලා පසු කලෙක ටේෆ් ගුරුවරයෙකු ලෙසත් අධ්‍යා-පනික තාක්ෂණික වෘත්තිකයෙකු ලෙසත් සේවය කරලා දැන් විශ්‍රාම සුවයෙන් කල් ගෙවනවා. ඔහු සිය ආදරණිය පවුලත් එක්ක ජීවත් වෙන්නෙ බ්‍රිස්බේන් නගරයේ. karoonka.com කියන්නෙ ඔහුගෙ විශ්‍රාම ජීවිතයේ අග්‍ර ඵලයක් කියලයි මට හි-තෙන්නෙ.

**01. ඔබ karoonka.com නමින් වෙබ් අඩවයක් නිර්මාණය කරන්නට හිතුවේ ඇයි?**

මම සිංහල කවි කෙටිකතා ලියන්න පටන් ගත්තේ ඒවා ප්‍රසිද්ධ කිරීමේ කිසිම අදහසක් ඇතුව නොවෙයි. 2009 දී රැකියාවෙන් විශ්‍රාම ගත්තායින් පසු ලිවූ පළමු කවියෙන් (ගයන්න වයන්න ගව) පසු තව කවි කීප-යකුත් කෙටිකතා කීපයකුත් මගේ කොම්පියුටරේ පමණයි ජීවත්වුණේ. ලංකා-වේ නෑදෑයන් කීප දෙනෙකුට ඊමේල් මගින් යැවීම මගේ නිර්මාණ බෙදාහැරීමේ එකම ක්‍රමය වුණා. නමුත් නිර්මාණ දහ පහලව-ක් ලියා අවසන් කිරීමෙන් පසුවත් ලිවීමේ ආසාව නැතිවුණේ නැති නිසයි බෙදාහැරීමේ වෙනත් ක්‍රමයක් ගැන හිතුවේ.

මගේ අන්තිම රස්සාව කොම්පියුටර් තාක්ෂණයට සම්බන්ධ නිසා වෙබ් අඩවියක් හදාගැනීම ප්‍රශ්නයක් හැටියට මම දැක්කෙ නෑ. "කරුංකා" නම ගත්තේ hard and unhealthy නිසා. karoonka.com දියත් කිරීමෙන් පසු මා ලියූ දෙයින් වැඩි හරියක් කෙලින්ම ඒ වෙත යොමුවුණා.

කවි සහ කෙටිකතා හැර දිගටම ලියලන දිග කතාවකුත් මුනුබුරු මිනිබිරියන් සඳහා ලිවූ ඉංග්‍රීසි කතා කිහිපයකුත් වෙබ් අඩවියට එකතුකළා. වරින් වර අළුත් දේ එකතු වුණත් මගේ වෙබ් අඩවිය නිතරම ලිවීමට සති කිහිපයක් පිටිපසිනුයි ඉන්නේ.

**02. ඔබේ කෙටිකතා සෑහෙන ප්‍රමාණයක දිගින් දිගට අපට හමුවන "අප්පුහාමි" නම් චරිතය ගොඩනැගුවේ කෙසේද?**

"අප්පුහාමි" චරිතය ගැන කිවයුතු දේ කිහිප පැත්තකින් බැලිය යුතුයි.
මා කුඩා කාලයේ එනම් වයස අවුරුදු දහයට අඩු කාලේ අපේ ගමේ හොල්මන් කථා සුලබයි. ගෙවල් කිට්ටුව "මළුව" ලෙස හැඳින්වූ කොකෝ අරඹේ හොල්මන් ඇති බව අප විශ්වාස කළා.ඒ කිට්ටුව පාරේ බෝක්කුවක් ලඟ තිබූ අට්ටික්කා ගහක දෙවි කෙනෙක් ඇති බව "ඇන්ඩි" නැමැති මිනිහෙක් කියා තිබුනට අප ඒක විශ්වාස කළේ නෑ(ඇන්ඩි නිතරම බොරු කිව්වළු). ඒ කෙසේ වෙතත් "අප්පුහාමි"ගැන අදහස ආවේ එතනින්.

"අප්පුහාමි" යන නම පාවිච්චි කිරීමට වෙනත් හේතුවක් තිබුණා. ඒක නිතරම වගේ විහිළුවට පාවිච්චි වුණ නමක්. මගෙ පුංචි අයියා මගෙන් "අප්පුහාමි ටවුමට යනවද?" කියලා ඇහුවේ මම ටවුමට යනවද කියලා දැනගන්නයි. (ඒකට හරි උත්තරේ "නෑ රාළහාමි" කියන එක)එය නමට නින්දා කිරීමක් හෝ ඇඳකිරීමක් හැමියට අප දැක්කේ නැහැ.

ඉස්කෝලේ යන කාලේ මම කේ. ලයනල් පෙරේරාගේ "අඟහරු ලොවෙන් ආ මිනිසා" කියන පොත කියෙව්වා. මිනිස් ජාතිය හැරුණු කොට වෙනත් බුද්ධිමත් සත්ත්වයන් ජීවත්වීම ගැන මම සසලවුණේ නැහැ. ඒ ගැන කුතුහලයක් නම් ඇතිවුණා. වැඩිහිටියෙක් හැටියට Terry Pratchett, Douglas Adams වැනි අයගේ පොත් මම නැවත නැවත කියෙව්වා. අප්පුහාමි නම් චරිතය පණගැන්වීමට මේ සියල්ල උදව් වුණා. අප්පුහාමි ගැන ලියූ කතා කිහිපයක් එකතු කිරීමට මා හිතුවේ P.G. Wodehouse ගේ කතා ගැන හිතලයි. එකම චරිත ටිකක් කතා ගොන්නකට ඇතුලත් කිරීමේ ක්‍රමවේදයක් ඔහු භාවිතා කළා.

අප්පුහාමි ගැන ලිවීමට පහසු වුණේ මා දන්නා පරිසරයක එම කතා පිහිටා තිබීම නිසයි. මාමා සහ නැන්දාගේ පවුලේ අය හැර සමහර චරිත අපේ ගමේ අයයි. වැස-"සට පාර සෝදා යෑම, සති අන්තයේ ගමේ යෑම, ගමෙන් "ගමේ කෑම" නගරයට ගෙන ඒම, ගෙදර කුස්සිය, කෑම කාමරේ, ඉස්තෝප්පුව, ඉස්සරහ කාමරේ, වගේ තැන් මට පුරුදුයි.ඒ වගේම කරාබු මුදලාලි ඇත්තටම හිටියා.ඒ වගේම තවමත් ඉන්නවා.

"අප්පුහාමි" කතා වල තේමා මගේ හිතෙන්ම පැන නැගුණ ඒවා මිස සත්‍ය සිද්ධීන්ට සම්බන්ධ නැහැ. බොහෝ විට කතා බීජ හිතට ආවේ පාන්දර තුනට හතරට ඇඳේ වැතිර ඉන්න විටයි. මේ සියල්ල මම "Poem and Story Ideas" කියලා ෆයිල් එකක සටහන් කරගත්තා. අළුතෙන් යමක් ලියන්න පටන් ගත්තේ ඉස්සර වෙලාම මේ ලැයිස්තුව බලලයි.

**03. ඔබේ වෘත්තීය ජීවිතය තුල දෙරටක අත්දැකීම් ඇසුරෙන් ලිවීමේදී වඩාත් රසවත් වස්තු බීජ සපයා ගතහැකි වූයේ කුමන අත්දැකීම් ඇසුරේද?**

මා ලියූ කතා මගේ ජීවිතේ කොතැනින් මතුවුනාද නිශ්චිතව කිව නොහැකියි. බොහෝ කතාවල අප වගේ අයගේ එදිනෙදා ජීවිත ගැන කියවෙනවා. ගැමි නාගරික, පෙරදිග අපරදිග, උගත්, නූගත්, පොහොසත්, දුප්පත්, සියල්ලෝ ජීවිතෙන් බලාපොරොත්තුවෙන්නේ ඒකාකාර දේ කියලයි මට හිතෙන්නේ. මේ අනුව, සෑම ජීවිතේකම දුක, සැප, ක්‍රෝධ, විහිළු, තරහ යනාදිය තිබීම මනුස්සකමේ හැටියක්. නමුත් ඔබ අසා ඇති ප්‍රශ්නය අනුව මගේ උත්තරය වෙන්නෙ මේකයි.
මගේ වෘත්තීය ජීවිතයෙන් ලිවීමට දායාදය වුනේ විද්‍යාවට ඇති ලැදිකමයි. සමහර කතා විද්‍යාව අනුව සම්පූර්ණ සත්‍ය නො-වෙයි. ("ලෝහ කැඳවන්නා") අනික් කතා විද්‍යාවට වඩාත් කිට්ටුයි. ("මොළෙන් දුවන්නෝ","තිරික්කලේ","ගලේ කෙටූ සටහන්") කොම්පියුටර් සම්බන්ධ කතාත් එසේමයි. මගේ භූ විද්‍යා වෘතියේ ක්ෂේත්‍ර වැඩ ආශ්‍රිත අත්දැකීම් "ගඟා" වැනි කතා වල අඩංගුයි. සමාජ - මනෝ විද්‍යා සම්බන්ධ කතා ("උත්තාපිගේ අමුතු දර්ශණ", "හිසේ කසල") මගේ මගේ වෘත්තියකට සම්බන්ධ නැති වුණත් ඇතැම් ක්ෂේත්‍ර වලට ඇති මගේ ඇල්ම නිසා ලියවුණ දේ.

ඔස්ට්‍රේලියාව අලලා ලිවූ කතා කිහිපයේ මගේ අත්දැකීම් මෙන්ම මගේ මිත්‍රයන්ගේ අත්දැකීමුත් වල මිශ්‍ර වීමක්. විශේෂයෙන්ම 1973 මා දුටු ඔස්ට්‍රේලියාවයි "ආගන්තුකයෝ" කතාවෙන් කියවෙන්නේ. "බැටළු ගීත" යන කතාවේ ගොවිපල හා එහි සිදුවන සිද්ධීන් මගේ සිතෙන් නැගුණ දේ මිස ඇත්ත සිද්ධි නොවෙයි. සමහර කතා ලංකා පසුබිමක සිදුවුණත් ඒවාගේ බටහිර අදහස් ගැබ් වී තිබුණා. ("උදා: අනික් පැත්ත")

**04. "ඉතිහාසය වෙනස් කරන්නෝ" වැනි කෙටිකතා තුලින් ඔබ මතුකිරීමට උත්සාහ කරන්නේ කෙබඳු ආකාරයේ මතයක්ද?**

මතයක් මතුකිරීම ගැන මම සිතුවේ නෑ. සීගිරි නගරය ගොඩනැගීමේදී කාශ්‍යප පිටින් උපකාර ලැබුවා නම් එය කෙසේ සිද්ධ විය හැකිද කියලා කල්පනා කළා. නමුත් එසේ උපකාර ලැබුවා යැයි මම කියන්නේ නැහැ. "රජ කුමරුගේ සිහින" කෙටිකතාව මම ලිව්වෙ කාශ්‍යප මොග්ගල්ලානටත් මිගාරටත් වඩා වෙනස් වෙන විදිහට. කතාව ලිවීමට පටන්ගෙන රන්මසු උයනේ පිහිනීමට යන තුරුත් ෆේස් බුක්" සම්බන්ධයක් මා හිතලා තිබුණේ නැහැ. ඒ ගැන අන්තර්ජාලයෙන් කියවා බලන වෙලාවෙයි මම දැක්කේ " රන්මසු උයනේ විශ්ව යතුර" කියන You Tube වීඩියෝව. එය විශ්වයේ ඕනෑම තැනකට යා හැකි දොරටුවක් රන්මසු උයනේ තිබෙන බවට ගෙතූ කතාවක් අඩංගු වීඩියෝ පටයක්. නමුත් ඒක නැරඹුවාම මට හිතුණා, විශ්වයේ කොහෙවත් නොයා කාලයේ ගමන් කරන්න. ඒත් අප කාටත් පුරුදු ෆේස් බුක් පාවිච්චි කරලා.
රජ කුමරුගේ සිහින කියන කතාව ලියුවට පස්සෙ මට හිතුනා "කරුංකා" නමින් අනාගතයෙන් ආ ෆේස්බුක් පාවිච්චි කරන්නාගේ පැත්තෙන් කාශ්‍යප කුමාරයා දිහා බලන්න. කාශ්‍යප අවුරුදු විස්සකදී කරන සාකච්චා කරුංකා එක රැකනිුයි කරන්නේ. එහි ප්‍රශ්නයක් ඇතැයි මා හිතන්නේ නැහැ.

"උදව්වට කෙනෙක් "කියන කෙටි කතාවට "දුනුකාර" නැමැත්තෙක් ගෙනාවෙ "නොනිමි කතා" කියන වෙනත් කෙටි කතාවකින්. ඒත් යම් දවසක මේ සියළු කතා එකිනෙකට සම්බන්ධ කිරීමේ අදහසින්. දුනුකාර ගැන නොදන්නා අයෙකුට මේ චරිතය ප්‍රශ්නයක් විය හැක්කේ ඇතැම් විට දුනුකාර ඉංග්‍රිසියෙන් පවා කතා කරන නිසා.

**05. ලිවීම ඔබට සමීපවන්නේ කෙසේද? පාසල්වියේ ඔබේ සාහිත්‍ය ගුරුවරයා පිළිබඳ මතකය අවධි කරන්න කැමතිද?**

අටේ පංතියෙන් පසුව මම ඉගෙනීම කළේ ඉංග්‍රීසියෙන් නිසා සිංහල භාෂාව ඉගෙන ගත්තේ විෂයයක් වශයෙන් පමණයි. ඒ කාලෙ විද්‍යා විෂයයන් සිංහලෙන් ඉගැන්නුවෙ නැහැ. සිංහල සාහිත්‍ය මම හදාරල නැහැ. සිංහල භාෂාවත් Syllabus B වශයෙන් පමණයි ඉගෙන ගන්න ලැබුණෙ. හයේ පංතියේ සිට අටේ පංතිය දක්වා සිංහල ඉගැන්වූ වික්‍රමගේ මහතා යම් විදිහකට අපට යමක් කියාදෙන්න උත්සාහ කළත් ඒ මතකයක් මට නැහැ. ඉන්පසු සුමිත්ත මහතා අපට සාමාන්‍ය පෙළ විභාගය සමත් වීමට උදව් දුන්නා මිස වෙන කිසි දෙයක් මට කිව නොහැකියි. පාසලෙන් පසුව විශ්ව විද්‍යාලවලත් රැකියා ස්ථාන වලත් ඉංග්‍රීසියෙන් වැඩ කළ නිසා සිංහල දැනුම ටිකක් පවත්වාගෙන ආවේ කියවීමෙන්.

සිංහල සාහිත්‍ය හදාරා නැතත් මම පොත්පත් කියවීම දිගටම කළා. මාර්ටින් වික්‍රමසිංහ , ටී.බී. ඉලංගරත්න, ජී.බී. සේනානායක වැනි අයගේ පොත් මම කියෙව්වා. කියවනවාට වැඩිය මගේ දක්ෂතාවය වන්නේ (ඒක දක්ෂතාවයක් නම්) කියවූ දේ මතකයේ රැඳීමයි. ඒ දිනවල කියවූ පොතපතේ සඳහන් බොහෝ දේ මට තවමත් මතකයි.

**06. කෙටිකතා සහ කවි ලිවීමේදී ඔබ අනුගමනය කරන ක්‍රමවේද ඔබටම ආවේනික වූ ඒවාද?**

ක්‍රම ගැන දැනුමක් නැති නිසා මට ක්‍රමයක් ඇතිද නැතිද යන්න කිව නොහැකියි. කවි ලිවීමේදී මම බලන්නේ එකම දෙයයි. කවියක තාලයකට කිවහැකි ලෙස වචන හැසිරවීම පමණයි. සමහර වචන වල තේරුම් කිහිපයක් තිබීම ඇතැම් වෙලාවට මට උදව්වක් වුණා. (ගෙදර සිංහල) මට ඉංග්‍රීසි කවි ලිවීමට නොහැක්කේත් මේ නිසාමයි. iambic pentameter මට නො-තේරෙන දෙයක්.

කතා ලිවීම ගැන මට ඇත්තේ එකම නීතියයි. කෙටි කතාව තනි අදහසක් ගැන පමණක් විය යුතුයි වැනි අදහසක් මම කොහේ හෝ කියවපු බවට මතකයක් මට තියෙනවා. කතාවක් පටන් ගන්න වෙලාවේ එය ඉවර වෙන්නේ කෙසේද කියලා මම දන්නේ නෑ. නමුත් තේමාවට ඕනෑවට වැඩිය පීලි පනින්න දුන්නෙ නෑ.

**07. වසර 40 කට පෙර ලංකාවේ ජන සමාජය සහ අද වාතාවරණය ගැන ඔබේ අවංක මතය කවරක්ද?**

1973 දී ඔස්ට්‍රේලියාවට ආ මම පසුගිය අවුරුදු තිහේදී අවුරුද්දකට වරක්-වත් ලංකාවට ගියා. සමහර විට දෙතුන් වර ගිහින් තියෙනවා. මගේ බිරිඳත් මමත් ලංකා-වෙ එකදිගට අවුරුද්දකට වැඩිය ඉඳලා තියෙනවා. ඒ 1977 සහ 1983 යන අවුරුදු වල. මගේ දුව ලියා සහ පුතා රවී අවුරුදු දෙක තුනකට සැරයක්වත් යනවා. මගේ

42 වන පිටුව